**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :95**
**ආයතනයේ නම : ශ්‍රී ලංකා පොලීසිය**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

***பாராளுமன்றவெளியீடுகளின் தொடர் :95***
***நிறுவனத்தின் பெயர் : இலங்கைப் பொலிஸ்***
***நிலையியற் கட்டளைஇலக்கம் 119(4) யின் அடிப்படையில் பொதுக் கணக்குகள் குழுவால் பாராளுமன்றத்திற்கு வழங்கப்பட்ட அறிக்கை தொடர்பிலான அவதானிப்புகளையும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளையும் சமர்ப்பித்தல்.***

**Parliamentary Series No : 95**
**Name of the institution : Sri Lanka Police**

**Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of the standing order No 119(4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 95

ආයතනයේ නම :- ශ්‍රීලංකා පොලීසිය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝගඅංක **119(4)** යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාඅංකය - 95

ආයතනයේ නම - ශ්‍රී ලංකා පොලිසිය

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | කාරක සභාවේ නිරීක්ෂණ /නිර්දේශ/ නියෝග | එකීඅඩුපාඩුනිවැරදිකිරීමසඳහාගත්පියවර/ වර්තමාන තත්වය |
|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ පද්ධතියක් පවත්වා ගැනීම සහ නව තාක්ෂණය යොදා ගැනීම.<br>ස්වයංක්‍රීය දඩපත් ක්‍රමය හඳුන්වා දී නොතිබීම,තොග පාලනය සම්බන්ධයෙන් අඩුපාඩු පැවතීම,අධිකරණයට යොමුකරන වැරදි සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු පද්ධතියක් නොතිබීම. | පොලිස් දෙපාර්තමේන්තුවෙන් සැපයෙන සේවාවන් හා එහි කාර්යයභාරය කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් දින වකවානු සහිත සමස්ත වැඩපිළිවෙල හා අපරාධ වළක්වා ගැනීම ඇතුළු පොලිස් පරීක්ෂණ සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම හා ඊට ඇති බාධාවන් ඇතුලත් ලිඛිත වාර්තාවක් මසක් ඇතුලත කාරක සභාව වෙත ලබා දෙන ලෙස. | ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර එය Gov – Pay ලෙස මේ වන විට ශ්‍රී ලංකා පොලිසිය තුල ක්‍රියාත්මක වන අතර තොග පාලනය කිරීම සඳහා සියලුම කොට්ඨාස ගබඩා ඒකාබද්ධ කර මධ්‍යගත ඒකකයක් තුලින් පවත්වාගෙන යාමට පරිගණක වැඩසටහනක් උපයෝගී කර ගැනීමට නියමිතව ඇති අතර ඒ සඳහා මෘදුකාංගයක් (Software) මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් ඇත.<br><br>සියලුම පැමිණිලි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ නිවසේ සිට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතින අතර ඒ සඳහා වන පිරිවැය 2026 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරවා ගැනීමට කටයුතු සිදු කර ඇත. එම ව්‍යාපෘතියේ අදියරයන් ලෙස පහත පද්ධති ආරම්භ කර මේ වන විට පවත්වාගෙන යනු ලබයි.<br><br>Ineed.police.lk පද්ධතිය - අස්ථානගත වී හෝ සොරකම් කරන ලද ජංගම දුරකථන සොයා දීමේ පද්ධතිය<br>telligp.police.lk පද්ධතිය - 2025.03.05 දින සිට ආරම්භ කර මේ වන විට පැමිණිලි ඉදිරිපත් කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | | | 119 පද්ධතිය - 119 හදිසි ඇමතුම් අංශය වෙත යොමුවන දුරකථන පණිවුඩ මගින් ලබා දෙන පැමිණිලි හා විස්තර මෙම පද්ධතියට ඇතුලත් කර එමගින් අදාල පොලිස් ස්ථාන හා කාර්යාලයන් වෙත යොමු කිරීම සිදු කරනු ලබයි.<br><br>මෙම දත්ත පද්ධතීන්ට අමතරව පහත දත්ත පද්ධතීන්ද මේ වන විට ශ්‍රී ලංකා පොලීසිය තුල ක්‍රියාත්මකව ඇත.<br><br>1.යවනු ලබන ලිපි සහ එවනු ලබන ලිපි (inward & outward System) නමින් වූ පරිගණක පද්ධතිය ( මෙම දත්ත පද්ධතිය මේ වන විට පොලිස්පති කාර්යාලය / ජ්‍යෙ.නි.පො.ප (පරිපාලන) කාර්යාලය , ජ්‍යෙ.නි.පො.ප / සහායක සේවා කාර්යාලය ඇතුළු කාර්යාල කිහිපයක ක්‍රියාත්මක වන අතර ඉදිරියේදී ශ්‍රී ලංකා පොලීසියේ සියලුම කාර්යාලයන්හි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් ඇත.)<br>2.පොලිස් නිලධාරීන්ගේ රාජකාරි / විවේකය වාර්තා කිරීම හා රාජකාරි ලේඛනය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීමට හැකි වන පරිදි සකස් කර ඇති දත්ත පද්ධතිය<br><br>3.පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මගින් විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන් සම්බන්ධ දත්ත ඇතුලත් පද්ධතිය (pnb.imc.police.lk)<br><br>4.පොලිස් පිරවුම් හලෙහි ඉන්ධන නිකුත් කිරීම විධිමත් කිරීම සඳහා වන පරිගණක වැඩසටහන (full.imc.police.lk) |

| | | | |
|---|---|---|---|
| | | | 5.ශ්‍රී ලංකා පොලීසිය මගින් අත්සන් කර ඇති ගිවිසුම් සම්බන්ධ විස්තර ඇතුලත් දත්ත පද්ධතිය (imc.police.lk/agreement ) |
| 02 | 2016.06.22 දින පැවති කාරක සභාවේ සාකච්ඡා සටහනේ 4.1 සිට 5.9 දක්වා ඡේදවල සඳහන් කරුණු. | මෙම කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා සමග සාකච්ඡාකර ඒ පිළිබඳ වාර්තාවක් 2023 ජුලි මස 01 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත කාරක සභාව නියෝග කළේය. | |
| | 4.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම. | | වර්තමාන මිලදී ගැනීම් වලදී, අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පිරිවිතර සකස් කර ඒ අනුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට ක්‍රියා කරනු ලැබේ. |
| | 4.2 ගිවිසුම් කඩකර විදෙස් ගතවූ පොලිස් නිලධාරියෙකුගෙන් දණ්ඩන මුදල අයකර නොගැනීම. | | විත්තිකරු වන හිටපු පොලිස් පරීක්ෂක ඩී.කේ.ආර් විජේසිංහ නිලධාරියාගෙන් රජයට අයවිය යුතු රු. 489,720.00 ක මුදල 2024.03.18 දින ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ගිණුම් අංක 7041433 දරණ ගිණුම වෙත තැන්පත් කර ඇත. |
| | 4.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා. | | ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දමා තිබීම පිළිබඳව 2016.06.22 දින පැවති කාරක සභාවේ සාකච්ඡා සටහනේ 4.3 ඡේදය යටතේ විමසුම් කර ඇත. අක්කර 05 රූඩ් 02 පර්චස් 07.2 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත ප්‍රාදේශීය ලේකම් ඉංගිරිය විසින් 2024.02.21 දින පවරා දී ඇති අතර මෙම ඉඩම සහ ගොඩනැගිලි (අඩක් නිමකර ඇති) පොලිස් සේවස්ථ පුහුණු ඒකකයක් සහ රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉංගිරිය පිවිසුමේ රථවාහන පොලිස් ඒකකය |

| | | | |
|---|---|---|---|
| | | | පිහිටුවීමට යොදාගැනීමට නියමිතව ඇති අතර ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීමටද නියමිතව ඇත. (යෝජිත ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමත දළ ඇස්තමේන්තුව රු. 2,642,290.54 ක් වන අතර 2025.04.07 දින මිල ගණන් විවෘත කර ඇත.) |
| | 5.1 පොලිස් ත්‍යාග අරමුදලින් ලබා දී තිබූ අත්තිකාරම්. | | පොලිස් අනුග්‍රහ අරමුදලට පොලිස් ත්‍යාග අරමුදලෙන් ලබා දී ඇති රු. මිලියන 2 ක අත්තිකාරම පොලිස් නිලධාරීන්ගේ යහපත සඳහා වැයකල මුදලක් සේ සලකා 2021.04.23 දින එම මුදල ප්‍රධානයක් ලෙස ගිණුම්ගත කර නිරවුල් කර ඇත. ඉදිරියේදී අරමුදල් සම්බන්ධයෙන් එවැනි තත්වයන් ඇති නොවීමට වගබලා ගත යුතු බවට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. |
| | 5.2 ප්‍රයෝජනයට නොගත් උපකරණ. | | මෝටර් වාහන සෝදිසි කිරීමේ උපකරණ කට්ටල 08 ක ප්‍රමාණය මේ වන විට පොලිස් විශේෂ කාර්යය බලකාය වෙත නිකුත්කිරීමේ නියෝග මගින් භාර දීම සිදු කර ඇති අතර ප්‍රභූ ආරක්ෂක රාජකාරි වලදී එම උපකරණ භාවිතා කරනු ලැබේ. |
| | 5.3 විධිමත් බලපත්‍ර ලබා නොගත් පුද්ගලික ආයතන වලින් සතුන් හා සත්ව ආහාර මිලදී ගැනීම. | | වර්තමානයේදී සතුන් ආනයනය සම්බන්ධයෙන් සියලුම ආනයනකරුවන් 1982 අංක 29 දරණ සත්ව රෝග පනත යටතේ සෑම ආනයනයක්ම සඳහාම සත්ව නිශ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත යුතු පූර්ණ අවසර පත්‍රය ලබාගැනීම කළ යුතු අතර මෙම සහතික ඉදිරිපත් නොකරන සැපයුම්කරුවන්ට එම අයිතමයන් වරාය මගින් නිෂ්කාශනය කිරීමට නොහැක. එසේම මිලදී ගැනීමට නියමිත |

| | | | |
|---|---|---|---|
| | | | සතුන්ට අදාල International Veterinary health Certificate සැපයුම්කරුවන් වෙතින් ලබාගෙන එම වාර්තා ශ්‍රී ලංකා පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත ඉදිරිපත් කර එම වාර්තාද පදනම් කරගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කිරීමෙන් පසු එම නිර්දේශ මත ප්‍රසම්පාදනයේ ඉදිරි කටයුතු සිදු කරනු ලබයි.<br><br>සත්ව ආහාර ආනයනය කර බෙදා හැරීම හා විකිණීම සඳහා 1986 අංක 15 දරන සත්ව ආහාර පනතට අනුව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් වාර්ෂිකව ලබාගත යුතු බලපත්‍ර ලබාගන්නා සැපයුම් ආයතන වෙත පමණක් අනුමැතිය ලබාදෙනු ලබන බැවින් එකී බලපත්‍ර ඉදිරිපත් නොකරන සැපයුම්කරුවන් වෙතින් අදාල අයිතමයන් මිලදී ගැනීම සිදු නොකරයි. |
| | 5.4 ස්ථාවර වත්කම් ලේඛණය හා පරිගණක උපාංග සහ මෘදුකාංග ලේඛනයක් පවත්වා නොතිබීම. | | ශ්‍රී ලංකා පොලීසියට අයත් දේපළ ලේඛන ගත කිරීම සඳහා, ශ්‍රී ලංකා පොලීසිය සතු ස්ථාවර වත්කම් මෘදුකාංගයට දත්ත ඇතුලත් කිරීම සම්බන්ධව උපදෙස් ලබා දෙමින් සියලුම කොට්ඨාශ වෙත උපදෙස් පත්‍රිකාවක් යොමු කර ඇත.<br><br>මේ වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය මගින් රජයේ ස්ථාවර වත්කම් නියාමනය සඳහා ස්ථාවර වත්කම් මෘදුකාංගයක් සකස් කරමින් පවතින අතර ශ්‍රී ලංකා පොලීසියේ තොරතුරු එම කාර්යාලය වෙත ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | 5.5 අශ්වයින් 21 දෙනෙකු විදේශ සමාගමකින් මිලදීගැනීම් සහ අශ්වයින් මිය යාම. | | 2023.08.15 වන දින සිට 2028.08.14 වන දින දක්වා වසර 05 ක කාලසීමාවක් සඳහා උපසේවා සහකාර පොලිස් අධිකාරි (පශු වෛද්‍ය) තනතුර යටතේ අශ්වාරෝහක කොට්ඨාශය වෙත පශු වෛද්‍යවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත. අශ්වයන්ගේ සෞඛ්‍ය තත්වයන් නිසි අයුරින් පවත්වාගෙන යාම සඳහා පශු වෛද්‍ය උපදෙස් අනුව රුධිර සාම්පල ලබාගෙන අදාල පරීක්ෂණ වාර්තාවන්ට අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන අතර දෛනිකව අශ්වයින් සඳහා වැඩි වේලාවක් ස්ථාල වලින් පිටත නිදැල්ලේ සිටීමටද අවස්ථාව සලසා දී ඇත.<br>අශ්වයන්ට වැළදිය හැකි රෝගාබාධ සම්බන්ධව, හදිසි අසනීප අවස්ථාවකදී ලබාදෙන ප්‍රථමාධාර හා ප්‍රථමාධාර ලබාදෙන ක්‍රමවේදයන් පිළිබඳව මෙන්ම අශ්වයන්ගේ සෞඛ්‍ය තත්වයන් නිසි අයුරින් පවත්වාගෙන යාම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයේ විශේෂඥ පශු වෛද්‍යවරුන් මගින් අදාල නිලධාරින් හා අස්ගොව් සේවක මහතුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සිදු කරන අතර අශ්වයින්ගේ ආහාර සඳහා විදේශයෙන් ආනයනය කරනු ලබන අශ්ව ආහාර , විටමින් සහ ඖෂධ ලබා දීම සිදුකරනු ලබයි.<br><br>පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය කොළඹ පිටකොටුව ඕල්කට් මාවතෙහි ස්ථාපිත කර ඇති අතර එම ප්‍රදේශයේ පවතින උෂ්ණාධික දේශගුණික තත්වය අශ්වයන් සඳහා හිතකර නොවන බැවින් අශ්වයන්ට හිතකර සෞම්‍ය දේශගුණයක් සහිත හොරණ ප්‍රදේශයේ |

| | | | |
|---|---|---|---|
| | | | ඉඩමක අශ්වාරෝහක කොට්ඨාශය ස්ථාපිත කිරීම සුදුසු බවට යෝජනා වී ඇති අතර එම ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාගැනීමට කටයුතු කරමින් ඇත.<br>ඉඩම් හා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු උක්ත ඉඩම් කොටස ශ්‍රී ලංකා පොලීසියේ ඉල්ලීම ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ රජය වෙත අත්පත් කරගැනීමෙන් පසු එහි නිරවුල් භුක්තිය 2017.09.28 වන දින ප්‍රාදේශීය ලේකම්, හොරණ විසින් ශ්‍රී ලංකා පොලීසිය වෙත භාර දී ඇත.<br><br>ඉඩම් කොටස අත්පත් කර ගැනීමට එරෙහිව නඩුවක් පවරා ඇති අතර (රිට් අංක 380 / 2017 දරණ නඩුව) එම නඩුවේ තීන්දුව පරිදි ගරු අධිකරණය විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීමට අදාලව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ පළකර ඇති ගැසට් නිවේදනය අවලංගු කර , සාමාන්‍ය ක්‍රමවේදය යටතේ අත්කර ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කර ඇත. ඒ අනුව ඉඩම් අත්කරගැනීමේ පනතේ 09 වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය 2025.07.14 වන දින ප්‍රාදේශීය ලේකම්, හොරණ විසින් පවත්වා ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. |
| | 5.6 පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දූර්වලතා /අක්‍රමිකතා. | | වර්තමානයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී ශ්‍රී ලංකා පොලීසිය වෙත බැඳීමක් (Interest of conflict) |

| | | | |
|---|---|---|---|
| | | | නොමැති බවට සැපයුම්කරුවන් වෙතින් ප්‍රකාශයක් ලබාගැනීම සිදු කරනු ලබන අතර අව්‍යාජ සැපයුම්කරුවන් තෝරාගැනීමට සැමවිටම කටයුතු කළ යුතු බවට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. |
| | 5.7 ග්‍රහන අපරාධ. | | ශ්‍රී ලංකා පොලීසිය අපරාධ අවම කර ගැනීම සඳහා නව උපායමාර්ග ක්‍රියාත්මක කරමින් පවතී. ඒ යටතේ ජනතාව දැනුවත් කිරීම, පොලිස් නිලධාරීන් නව අපරාධ සම්බන්ධව පුහුණු පාඨමාලාවලට යොමුකර දැනුවත් කිරීම. අපරාධ අවම කිරීම සඳහා පොලිස් සංචාර යෙදවීම. දත්ත ගබඩාවන් හඳුන්වා දීම, නව තාක්ෂණයන් හඳුන්වා දීම ආදී විවිධ නව උපාය මාර්ග ඔස්සේ අපරාධ සිදුවීම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ අපරාධයන්ට සම්බන්ධ තොරතුරු ලබාගැනීමේදී අනෙකුත් වගකිය යුතු ආයතන දැනුවත් කිරීමෙන් සහ සහසම්බන්ධ වෙමින් කටයුතු කිරීම සිදු කරනු ලැබේ. |
| | 5.8 රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව. | | රිය අනතුරු වැලැක්වීම සඳහා රථවාහන මූලස්ථානයේ මහ පෙන්වීම යටතේ කටයුතු සිදු කරන අතර මාර්ග අනතුරු වලට බලපාන කරුණු විශ්ලේෂණය කරමින් ඒවා වැලැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව රථවාහන මූලස්ථානය මගින් කොට්ඨාස වෙත උපදෙස් ලබා දෙමින් එම කටයුතු සිදු වන්නේද යන්න අධීක්ෂණය කර අදාල පසු විපරම් සිදු කරනු ලැබේ. |
| | 5.9 නීති විරෝධී නිද්‍රාජනක ද්‍රව්‍ය වාර්තා වීම,අත්අඩංගුවට ගැනීම සහ නඩු පැවරීම. | | නීති විරෝධී නිද්‍රාජනක ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ ඒකාබද්ධ වී මෙහෙයුම් සිදු කිරීම, දැනට පවතින කාර්ය මණ්ඩලය |

| | | | |
|---|---|---|---|
| | | | වැඩි කිරීම, රට තුල සමාජගත වී ඇති මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම සඳහා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධ වැටලීම් පුළුල් කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සම්බන්ධව පුනරුත්තාපන ක්‍රියාවලියහා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදි ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 03. | සංසන්දනාත්මකව ගත් කළ 2019 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය තුළ අපරාධවල වැඩිවීම. | සැකකරුවෙකු වශයෙන් දත්ත පද්ධති තුළට ඇතුළත් කර ගන්නා පුද්ගලයෙකු අදාල වරදින් නිදහස් කිරීමෙන් අනතුරුව එම පුද්ගලයන් දත්ත පද්ධති වලින් ඉවත් කිරීම හැකි ඉක්මනින් කිරීමේ වැදගත් කම ,මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි හා ඒවාට අදාල වරදකරුවන් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම අවශ්‍ය බව කාරක සභාව පෙන්වා දුන්නේය. | අපරාධ වාර්තා කොට්ඨාශයේ අපරාධකරුවන් හෝ සැකකරුවන් සම්බන්ධව දත්ත ඇතුලත් කිරීම දත්ත පද්ධති 05 කට අදාලව සිදු වේ.<br>AFIS (Automated Fingerprints Identification System) දත්ත පද්ධතිය වෙතඅපරාධයන්ට අදාල චූදිතයන්ට අධිකරණ මගින් දඩුවම් ලබා දීමෙන් පසු පමණක් ඒ සම්බන්ධ දත්ත ඇතුලත් කරන අතර අධිකරණය මගින් චූදිතයන් නිදොස්කොට නිදහස් කරනු ලබන අවස්ථාවලදී දත්ත පද්ධතියේ ඇති දත්ත අවලංගු කිරීමට කටයුතු කරනු ලබයි.<br><br>AMIS ( Arrested Monitoring Information System) CIMS (Criminal Information Management System) , OCAU (Organized Crimes Analysis Unit) හා AFRS (Automated Facial Recognition System) යන දත්ත පද්ධති වල තොරතුරු, යම් පුද්ගලයෙකු නැවත අපරාධ සඳහා අත්අඩංගුවට ගතහොත් විමර්ශන කාර්යයට පමණක් යොදාගන්නා අතරකිසිදු අවස්ථාවක එම තොරතුරු ඔවුන්ගේ පෙර වැරදි ලෙසට අධිකරණයට හෝ පොලිස් නිශ්කාෂණ |

| | | | |
|---|---|---|---|
| | | | වාර්තා නිකුත් කිරීමට යොදා නොගන්නා අතර මෙම දත්ත පද්ධතීන් මගින් පුද්ගලයෙකුට අනීතිකව අගතියක් සිදු නොවේ.<br><br>මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත් අඩංගුවට ගනු ලබන පුද්ගලයන්ගේ තොරතුරු ඇතුලත් කිරීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය තුල NIS ( Narcotics information system ) ලෙස දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන අතර එය දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙතින් තොරතුරු ලබාගෙන දෛනිකව යථාවත් කිරීමට පියවර ගෙන ඇත. |
| 04. | අපරාධ නඩු විසදීම. | අධිකරණ කටයුතු වලට සහභාගී වන පොලිස් නිලධාරීන්ට සිදුවන අපහසුතා වළක්වා පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට හැකිවන සේ පොලිස්පති විසින් නිකුත් කරනු ලබන අදාල සියළු චක්‍රලේඛ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස පොලිස්පති වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි. | අධිකරණ කටයුතු වලට සහභාගී වන පොලිස් නිලධාරීන්ට සිදුවන අපහසුතා වළක්වා පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට හැකිවන සේ පොලිස්පති විසින් නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. |
| 05. | පොලිස් ත්‍යාග අරමුදල | පොලිස් ත්‍යාග අරමුදලින් ගෙවීම් කෙරෙන නියෝග නිසි ක්‍රමවේදයකට අනුව වර්තමානයට ගැලපෙන ලෙස යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙසත් පොලිස් ත්‍යාග අරමුදලට විශාල දායකත්වයක් ලබාදෙන රථවාහන පොලිස් නිලධාරීන් සඳහා ලබාදෙන ත්‍යාග මුදල් ප්‍රමාණය වැඩිකරන ලෙසත් පොලිස් දෙපාර්තමේන්තුව වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි. | 2025.03.01 දිනැති අංක 2778/2024(11) දරණ පොලිස්පති චක්‍රලේඛනය මගින් ගෙවීම් යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| 06. | කාර්ය මණ්ඩලය | නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිලිබඳව සලකා බැලූ කාරක සභාව කාන්තා පොලිස් නිලධාරී තනතුරු වල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබීම පිලිබඳව විමසීමක් කළේය. එසේම කාන්තා පොලිස් නිලධාරි තනතුරුවල ඇති පුරප්පාඩු හේතුවෙන් කාන්තා හා ළමා පැමිණිලි සම්බන්ධයෙන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීමක් නොවන බව කාරක සභාවේ අවධානයට ලක්විය. | කා.නි.පො.ප තනතුරට උසස් කිරීම සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව සුදුසුකම් ලබා ඇති කා.ජ්‍යෙ.පො.අධිකාරි තනතුරේ නිලධාරිණියන්ගෙන් අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසු කා.නි.පො.ප තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>කා.ප්‍ර.පො.ප. සහ ඉන් පහළ තනතුරු වල පවතින පුරප්පාඩු වලින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ සඳහන් ජ්‍යෙෂ්ඨතාවය පදනම යටතේ වෙන් කර ඇති ප්‍රතිශතයට අදාල පුරප්පාඩු ප්‍රමාණය සඳහා උසස්වීම් ලබා දීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට, ජාතික පොලිස් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීම සඳහා 2025.07.15 දින ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලිපි යොමු කර ඇති අතර, ඒ අනුව එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නියමිතව ඇත.<br><br>2025.08.08. දින වන විට කා.පො.කො. තනතුරේ පුරප්පාඩු 4,040 ක් පවතින අතර එයින් 500 ක ප්‍රමාණයක් ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතව ඇත.<br><br>පොලිස් ස්ථාන ශ්‍රේණිගත කිරීමට අනුව ඒ ඒ පොලිස් ස්ථානයන්හි ළමා හා කාන්තා කාර්යාංශවල සහ කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශවල සිටිය යුතු කාන්තා නිලධාරිණියන් ප්‍රමාණය |

| | | | |
|---|---|---|---|
| | | | සඳහන් කර ඇති අතර ඒ අනුව ළමා හා කාන්තා කාර්යාංශවල පැවති කාන්තා නිලධාරිණියන්ගේ ඌනතාවයන් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. |
| | | පොලිස් ස්ථානවලට නිශ්චිත අනුමත කාර්ය මණ්ඩලයක් නොපැවතීම, ඇතැම් නිලධාරීන්ට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දීම සහායක තනතුරු පුරප්පාඩු නිල ඇඳුම් කාර්ය මණ්ඩලයෙන් පිරවීම වැනි සංකීර්ණතා හේතුවෙන් පුරප්පාඩු සහ අතිරික්ත තනතුරු ප්‍රමාණයන් නිශ්චිත වශයෙන් දැක්විය නොහැකි බව කාරක සභාව නිරීක්ෂණය කලේය.<br><br>එසේම බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය විධිමත් අයුරින් ක්‍රියාත්මක නොවන බව ද කාරක සභාව නිරීක්ෂණය කලේය. | ශ්‍රී ලංකා පොලීසියේ සාමාන්‍ය සේවය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ පොලිස් සහායක සේවය සඳහා නිලයන් වශයෙන් වෙන වෙනම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර ශ්‍රී ලංකා පොලීසිය සඳහා අනුමත පොලිස් සහායක සේවාවන්හි තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව සහායක සේවා තනතුරු සඳහා නිළ ඇඳුම් කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු පිරවීම ඉදිරියේදී සිදු නොවනු ඇත.<br><br>ශ්‍රී ලංකා පොලීසියේ රාජ්‍ය නිවේදිත තනතුරුවලට අදාල බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය 2019.07.19 දින සිට ක්‍රියාත්මක වන අතර පොලිස් කොස්තාපල් තනතුරේ සිට මහ සැරයන් තනතුර දක්වා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය 2025.04.24 දින ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.<br>අනෙකුත් තනතුරුවලට (උපපොලිස් පරීක්ෂක සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා වූ තනතුරු සහ රියදුරු තනතුරු) අදාලව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටින් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| | | පොලිස් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ පවතින කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ඉල්ලීම් සිදුකර කාරක | ශ්‍රී ලංකා පොලීසිය සඳහා අනුමත සංවර්ධන නිලධාරි තනතුරු 533 න් පුරප්පාඩු 226 ක් පිරවීම සඳහා, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය |

| | | | |
|---|---|---|---|
| | | සභාව වෙත වාර්තා කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි. | සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුවේ අනුමැතිය ලැබී ඇත (අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/RRPCM/2025/decision හා 2025.04.02 දිනැති ලිපිය මගින්) ඒ අනුව නිලධාරීන් ලබා දෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇති අතර එම නිලධාරීන්ගෙන් අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරීන් 28 දෙනෙක් අනුයුක්ත කිරීම සඳහා නියමිතව ඇත. |
| 07. | පොලිස් මධ්‍යම අවි ගබඩාවේ පවතින අඩුපාඩු. | ලංකාව පුරා සියලුම පොලිස් ස්ථානවල ඇති කල් ඉකුත් වූ කඳුළු වායු (Tear Gas shells) සහ කඳුළු වායු අත්බෝම්බ (Tear Gas Grenades ) මෙන්ම කල් ඉකුත් වූ අවි අපහරණය කිරීම කඩිනම් කරන ලෙස කාරක සභාව විසින් නියෝග කරන ලදි.එසේම මෙවැනි ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ප්‍රමාණය ඉක්මවා ඇණවුම් කිරීම නිසා මුදල් නාස්තියක් සිදුවන බව පෙන්වා දුන් කාරක සභාව එසේ නොවීමට කටයුතු කිරීමට සැලකිලිමත් වන ලෙසද අවධාරණය කළේය. | 2024.10.04. දින වන විට දිවයින පුරා සියළුම පොලිස් ස්ථාන වෙත නිකුත්කර තිබූ කල් ඉකුත් වූ කඳුළු වායු (Tear Gas shells) සහ කඳුළු වායු අත්බෝම්බ (Tear Gas Grenades ) මධ්‍යම අවි ගබඩාවට ගෙන්වාගෙන විනාශ කිරීමට කටයුතු කර ඇත.<br>පවත්නා තොග කල් ඉකුත් වන දිනයන් පිළිබඳව සැලකිළිමත්ව ඇණවුම් කිරීම සිදුකරන අතර අවසන් වරට 2023.10.19 දින කඳුළු වායු පතරොම් 10,000 ක් හා කඳුළු වායු බෝම්බ 5,000 ක් ආනයනය කිරීමට කටයුතු කර ඇත. |
| 08. | ජාත්‍යන්තර සම්මුතීන් අනුව කඳුළු ගෑස් යොදා ගැනීම සහ කැරලි කෝලාහලවලදී මහජනයා පාලනය. | ජාත්‍යන්තර සම්මුතීන් අනුව කඳුළු ගෑස් යොදා ගැනීම සහ කැරලි කෝලාහලවලදී මහ ජනයා පාලනය.සඳහා අනුගමනය කළ යුතු නීතිරීති , සම්මුතීන් පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින්ද මාර්ගෝපදේශ ලබා ගෙන ඒ අනුව කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳ වාර්තාවක් 2023 ජුනි මස 01 දිනට | නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීමේදී දැනට භාවිතා කරන ක්‍රමවේදයන් හා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති , මහජන කැලඹීම් වලදී පොලීසිය විසින් බලය භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශන මාලාව පිළිබඳව කරුණු අධ්‍යයනය කරමින් පවතින අතර නීතිපති උපදෙස් ලබා ගැනීමටද කටයුතු කරමින් ඇත. |

| | | | |
|---|---|---|---|
| | | පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදි. | නීතිපති උපදෙස් ලද විගස මහජන කැලඹීම් වලදී පොලිසිය විසින් බලය භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශන මාලාවක් සකස් කිරීමට නියමිතව ඇත. |
| 09. | මධ්‍යම අවි ගබඩාව සතුව දත්ත පද්ධතියක් නොතිබීම සහ කල් ඉකුත් වූ අවි ආයුධ තබා ගැනීමේ අනතුරුදායක බව. | | 2024 වර්ෂයේදී මෘදුකාංග පද්ධතියක් සකස්කර ඇති අතර මෙම මෘදුකාංග පද්ධතිය 2024.12.06 දින සිට තොරතුරු තාක්ෂණ කොට්ඨාසය මගින් හසුරවාගෙන යාමට කටයුතු කර ඇත. |
| 10. | පොලිස් සේවය කාර්යක්ෂමව පවත්වා ගැනීම | මේ සඳහා පොලිස් ස්ථාන ,උසාවි,බන්ධනාගාර සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ආදී සියලු අදාළ ආයතන එකිනෙක සම්බන්ධ විය හැකි වැඩ පිළිවෙළක් පැවතීමේ වැදගත්කම කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි. | පොලිස් සේවය කාර්යක්ෂමව පවත්වා ගැනීම උදෙසා සෑම පොලිස් ස්ථානයක්ම VPN මගින් අන්තර්ජාලය හා සම්බන්ධ කර ඇති අතර අපරාධ වාර්තා කොට්ඨාශයේ ඇති AFIS (Automated Fingerprints Identification System) , AMIS ( Arrested Monitoring Information System)හා CIAS ( Criminal Intelligence Analise System)යන දත්ත පද්ධති සඳහා සෑම පොලිස් ස්ථානයකටම සෘජු සම්බන්ධතාවයක් ලබා දී ඇත.එමගින් පොලිස් ස්ථානයේ සිටම දත්ත පරිපාලනය කර ගැනීමට පොලිස් ස්ථාන වෙත හැකියාව ලැබී ඇත.<br>ආගමන විගමන දෙපාර්තමේන්තුවේ හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාත්මක වීමට නියමිතව ඇති E – Passport හා E – Nic යන දත්ත පද්ධති සමඟ හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කිරීමට නියමිතව ඇති PIMS - Prison Information Management System යන දත්ත පද්ධතිය සමඟද සම්බන්ධ වීමේ හැකියාව ශ්‍රී ලංකා |

| | | | |
|---|---|---|---|
| | | | පොලීසිය වෙත ඉදිරියේදී හිමිවන අතර අදාල ආයතන විසින් ඒ සඳහා එකඟතාවය පළකර ඇත<br><br>අධිකරණවල ඇති සියළුම දත්ත ඒකාබද්ධ කිරීමට අධිකරණ අමාත්‍යාංශය එක්සත් ජාතින්ගේ සංවිධානය සමඟ සම්බන්ධ වී පහත සඳහන් ක්‍රියාමාර්ග ( UNDP – United Nation Development Project) ගනිමින් පවතින අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් පසුව අධිකරණය සමඟද සම්බන්ධ වීමේ හැකියාව ශ්‍රී ලංකා පොලීසිය වෙත හිමිවේ.<br>Data Snapshot for the Justice Sector<br>Rapid Digital Strategy for the Justice Sector |
| 11. | රියැදුරු බලපත්‍ර සඳහා ලකුණු අකුසලතා ක්‍රමය (Demerit Points System) | මෙම ලකුණු අකුසලතා ක්‍රමය (Demerit Points System) ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස කාරක සභාව විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කරන ලදී. | මේ වන විට ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන ආයතනය (ICTA) මගින් ක්‍රියාත්මක කරනු ලබන ක්ෂණික දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදය සමඟ මෙම ලකුණු අකුසලතා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව හා ලකුණු අකුසලතා ක්‍රමවේදය සකස් කිරීම පිළිබඳව මෝටර් රථ කොමසාරිස් කාර්යාලය, ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව හා එක්ව සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. |
| 12 | පොලිස් නිලධාරීන් සඳහා භාෂා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | පොලිස් නිලධාරීන්ට ඇති භාෂා ගැටළු හේතුවෙන් දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශවල රාජකාරි කිරීමේ දී සහ සංචාරකයන් සමග සම්බන්ධ වීමට සිදුවන අවස්ථා වලදී දුෂ්කරතා රැසකට මුහුන දෙන බව පෙන්වා දුන් කාරක | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මගින් පොලිස් නිලධාරින් සඳහා දිවයින පුරා සියළුම පළාත් ආවරණය වන පරිදි සේවස්ථ පුහුණු ඒකක 09 ක් මගින් හා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති |

| | | | |
|---|---|---|---|
| | | සභාව එවැනි නිලධාරීන්ට භාෂා පුහුණුව ලබා දීමේ වැදගත්කම අවධාරණය කලේය. | අතර එම වැඩසටහන් යටතේ 2023 වර්ෂයේදී නිලධාරින් 2379 ක්ද 2024 වර්ෂයේදී නිලධාරින් 3079 ක්ද 2025 වර්ෂයේ මේ දක්වා කාලය තුල නිලධාරින් 2675 ක් දෙමළ භාෂා පාඨමාලාව හදාරා ඇති අතර මෙම භාෂා පුහුණු වැඩසටහන් අඛණ්ඩව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. |

ආනන්ද විජේපාල (පා.ම.)
පාර්ලිමේන්තු කටයුතු සහ මහජන ආරක්ෂක අමාත්‍ය